# තනතුරු ඇබෑර්තු

## ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ III වැනි ශ්‍රේණිය සඳහා වෘත්තීය සුදුසුකම් හා කුසලතා මත සෘජු බඳවා ගැනීම - 2021(2025)

අංක 1670/33 සහ 2010.09.10 වැනි දින දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 7.4 ඡේදයේ පරිදි ගණකාධිකාරී සේවයේ III වැනි ශ්‍රේණියේ ගණකාධිකාරී තනතුරු සඳහා වෘත්තීය සුදුසුකම් හා කුසලතා මත සෘජු බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. පහත දක්වා ඇති ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කළ අයදුම්පත් **2025.06.16** දින හෝ එදිනට පෙර, කොළඹ 07, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත බහා එවන ලිපි කවරයේ වම්පස උඩ කෙළවරේ ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ III ශ්‍රේණියේ තනතුරු සඳහා සෘජු බඳවා ගැනීමේ අයදුම්පත යනුවෙන් සඳහන් කළ යුතු ය.

02. *බඳවා ගැනීමේ ක්‍රමය :*

ගණකාධිකාරී සේවයේ වෘත්තීය සුදුසුකම් මත කුසලතා පදනමින් III වැනි ශ්‍රේණියේ පුරප්පාඩු 43 ට නොවැඩි සංඛ්‍යාවකට පත් කිරීම සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති පුද්ගලයින්ගෙන් ප්‍රසිද්ධ දැන්වීම් මගින් අයදුම්පත් කැඳවා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත නිලධාරීන් තෝරාගනු ලැබේ. අපේක්ෂකයින් කැමති එක් භාෂාවකින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටිය හැක.

03. *සේවා කොන්දේසි :*

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1670/33 සහ 2010.09.10 වැනි දින දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවා ව්‍යවස්ථා කොන්දේසිවලට ද, එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින් මතු කරනු ලබන සංශෝධනවලට ද, යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයින් ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ III ශ්‍රේණියට පත් කරනු ලබයි.

i. මෙම පත්වීම ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතු වේ. තව ද ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය. රජය මගින් විටින්විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

ii. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 අනුව භාෂා ප්‍රවීණතාවය ලබාගත යුතු ය.

iii. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, රජයේ වෙනත් රෙගුලාසි, චක්‍රලේඛ හා උපදෙස්වලට ද ඒවාට අදාළව වරින්වර නිකුත් කරනු ලබන සංශෝධනවලට ද මෙම පත්වීම යටත්වේ.

iv. පත්වීම් මාධ්‍යය වනුයේ ඔබ සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටින මාධ්‍යය වේ

04. *වැටුප් ව්‍යුහය හා මාසික වැටුප් පරිමාණය :*

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 දරන වැටුප් චක්‍රලේඛයට අනුව SL 1-2025 වැටුප් කාණ්ඩය අනුව මෙම තනතුරට - **රු.82,150 – 10 x 2,400 - 8 x 2,940 - 17 x 3,900 - රු.195,970/-** ක මාසික වැටුප් පරිමාණය හිමිවේ.

(ඔබට වැටුප් ගෙවනු ලබන්නේ 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 හි උපලේඛන I යටතේ වර්ගීකරණය අනුව 2025.01.01 දිනට උපලේඛන III හි සඳහන් පරිදි වේ.)

05. *වෘත්තීය සුදුසුකම් :*

(i) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අවසාන පරීක්ෂණය;

*හෝ*

(ii) පොදු රාජ්‍ය මණ්ඩලීය රටක වරලත් ගණකාධිකාරී ආයතනයක අවසාන පරීක්ෂණය,

*හෝ*

(iii) පොදු රාජ්‍ය මණ්ඩලීය රටක වරලත් කළමනාකරණ ගණකාධිකාරීත්ව ආයතනයක අවසාන පරීක්ෂණය,

*හෝ*

(iv) සහතිකලත් වරලත් ගණකාධිකාරී ආයතනයේ අවසාන පරීක්ෂණය,

*හෝ*

(v) එක්සත් රාජධානියේ සහතිකලත් වරලත් ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ අවසාන පරීක්ෂණය සමත්ව තිබිය යුතුය.

06. *කායික සුදුසුකම් :*
සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය සඳහා අන් සෑම අයුරකින් ම ශාරීරික වශයෙන් යෝග්‍ය විය යුතුය.

07. *වෙනත් සුදුසුකම් :*

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය,

(ii) විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය,

(iii) යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තෙකු ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවා ව්‍යවස්ථාවේ 7.4.2.6 (iii) පරිදි සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට සුදුසුකම් නොලබයි,

(iv) සුදුසුකම් ලබන දිනය,
සේවයට පත්කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු ඉහත සඳහන් අවශ්‍ය සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ කරන දිනට සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබේ නම් පමණි. සුදුසුකම් සනාථ කිරීම සඳහා අවශ්‍ය වන සහතිකවල පිටපත් අයදුම්පත්‍රය සමඟ අනිවාර්යයෙන් ම ඉදිරිපත් කළ යුතුය.

08. *වයස් සීමාව :*
නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ කරන දිනට වයස අවුරුදු 22 ට නොඅඩු හා වයස අවුරුදු 35 ට නොවැඩි විය යුතුය.

09. *පහත සඳහන් ලියවිලි අපේක්ෂකයෙකු විසින් සිය අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතුය.*

*(අ)* උප්පැන්න සහතිකයේ පිටපතක්,

*(ආ)* ඉහළම අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්වල පිටපත්,

*(ඇ)* මාස 06 ක් ඇතුළත ලබාගත් චරිත සහතික 2 ක් (මෙයින් එකක් සමාදාන විනිශ්චයකාරවරයකුගෙන් විය යුතුය)

10. *කුසලතා මත සෘජු බඳවා ගැනීමේ දී ව්‍යුහගත ලකුණුදීමේ පරිපාටිය :*

මූලික වෘත්තීය සුදුසුකමට අමතරව ලබා ඇති ඉහලම එක් සුදුසුකමක් සඳහා පමණක් ලකුණු ලබාදෙනු ලැබේ.

| *අනු අංකය* | *විෂය* | *ලකුණු* | *උපරිම ලකුණු* |
|---|---|---|---|
| 01 | *අමතර වෘත්තීය සුදුසුකම් :*<br>i. ශ්‍රීලංකා කාර්මික විද්‍යාලයේ/ශ්‍රී ලංකා උසස් කාර්මික අධ්‍යාපන ආයතනයේ ගණකාධිකරණය හෝ වානිජ්‍යය පිළිබඳ උසස් ඩිප්ලෝමාලාභියකු වීම; | 15 | 50 |
| | ii. වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ ආවසරික II / අන්තර් මාධ්‍යය පරීක්ෂණය / ගිණුම්කරන හා ව්‍යාපාරික සහතික පත්‍රය II / ව්‍යාපාර අදියර, වරලත් කළමනාකාරීත්ව ගණකාධිකාරී ආයතනයේ II අදියර පරීක්ෂණය, සහතිකලත් ගණකාධිකාරීන්ගේ වරලත් සංගමයේ වෘත්තීය I වැනි කොටසේ පරීක්ෂණය සමත් වීම; | 20 | |
| | iii. වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ අවසාන I කොටසේ පරීක්ෂණය සමත් වීම, වරලත් කළමනාකාරීත්ව ගණකාධිකාරී ආයතනයේ III අදියර පරීක්ෂණය සමත් වීම හෝ සහතිකලත් වරලත් ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ වෘත්තීය II වැනි කොටසේ පරීක්ෂණය සමත් වීම. | 30 | |
| | | | |

| අනු අංකය | විෂය | ලකුණු | උපරිම ලකුණු |
| --- | --- | --- | --- |
| | iv. වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ වරලත් කළමනාකාරිත්ව ගණකාධිකාරී ආයතනයේ හෝ සහතිකලත් වරලත් ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම හෝ වෙනත් යම් පිළිගත් වෘත්තීය සුදුසුකම් ;<br><br>v. වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ වරලත් කළමනාකාරිත්ව ගණකාධිකාරී ආයතනයේ හෝ සහතිකලත් වරලත් ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ අධි සාමාජිකත්වය ලබා තිබීම හෝ වෙනත් යම් පිළිගත් වෘත්තීය සුදුසුකම් ; | 40<br><br>50 | |
| 02. | අධ්‍යාපන සුදුසුකම්<br>i. සාමාන්‍ය උපාධිය - සාමාන්‍ය සාමාර්ථ<br>ii. විශේෂ උපාධිය - සාමාන්‍ය සාමාර්ථ<br>iii. 2 වැනි පෙළ සහිත සාමාන්‍ය උපාධිය<br>iv. 2 වැනි පෙළ සහිත විශේෂ උපාධිය<br>v. 1 වැනි පන්තිය සහිත සාමාන්‍ය උපාධිය<br>vi. 1 වැනි පන්තිය සහිත විශේෂ උපාධිය<br>vii. පශ්චාත් උපාධි ඩිප්ලෝමාව<br>(රාජ්‍ය මූල්‍ය කළමනාකරණය, මූල්‍ය කළමනාකරණය, රාජ්‍ය මූල්‍ය, ගිණුම්කරණය, සංවර්ධන මූල්‍ය, වානිජ්‍යය, ආර්ථික විද්‍යාව, ව්‍යාපාර පරිපාලන, රාජ්‍ය කළමනාකරණය, තොරතුරු තාක්ෂණය, රාජ්‍ය ප්‍රතිපත්ති, ව්‍යාපෘති කළමනාකරණය යන අදාළ ක්ෂේත්‍ර)<br>viii. පශ්චාත් උපාධි - නිබන්ධන රහිත<br>(රාජ්‍ය මූල්‍ය කළමනාකරණය, මූල්‍ය කළමනාකරණය, රාජ්‍ය මූල්‍ය, ගිණුම්කරණය, සංවර්ධන මූල්‍ය, වානිජ්‍යය, ආර්ථික විද්‍යාව, ව්‍යාපාර පරිපාලන, රාජ්‍ය කළමනාකරණය, තොරතුරු තාක්ෂණය, රාජ්‍ය ප්‍රතිපත්ති, ව්‍යාපෘති කළමනාකරණය යන අදාළ ක්ෂේත්‍ර)<br>ix. පශ්චාත් උපාධි - නිබන්ධන සහිත<br>(රාජ්‍ය මූල්‍ය කළමනාකරණය, මූල්‍ය කළමනාකරණය, රාජ්‍ය මූල්‍ය, ගිණුම්කරණය, සංවර්ධන මූල්‍ය, වානිජ්‍යය, ආර්ථික විද්‍යාව, ව්‍යාපාර පරිපාලන, රාජ්‍ය කළමනාකරණය, තොරතුරු තාක්ෂණය, රාජ්‍ය ප්‍රතිපත්ති, ව්‍යාපෘති කළමනාකරණය යන අදාළ ක්ෂේත්‍ර) | 10<br>12<br>12<br>13<br>13<br>15<br>17<br><br>20<br><br>25 | 25 |
| 03. | පළපුරුද්ද ;<br>වෘත්තීය සුදුසුකම් ලබාගැනීමෙන් අනතුරුව ලබාගත් පළපුරුද්ද මෙහිදී සළකා බලනු ලැබේ.<br>වර්ෂයකට ලකුණු 05 බැගින් වර්ෂ 4ක පළපුරුද්දට ලකුණු 20ක් මෙහිදී ලබාදෙනු ලබයි. | | 20 |
| 04. | සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සඳහා;<br>සම්මුඛ පරීක්ෂණයට මුහුණදීමේදී දක්වන කුසලතාවය සඳහා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සෑහීමට පත්වන පරිදි මෙම ලකුණු ප්‍රදානය කරනු ලැබේ. | | 05 |
| | එකතුව | | 100 |

11. රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ නියුක්ත නිලධාරියෙකු විසින් තමාගේ අයදුම්පතෙහි මුල් පිටපත ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ මාර්ගයෙන් "ලේකම්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය, නිදහස් චතුරශ්‍රය, කොළඹ 07 " යන ලිපිනයට ඉදිරිපත් කළ යුතුය. එහි පිටපතක් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට ප්‍රථම කෙලින්ම මෙම ලිපිනයට යොමු කළ හැකිය.

12. ඉල්ලුම් කිරීමේ ක්‍රමය :

(අ) ඉල්ලුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූලවිය යුතු අතර එය A4 ප්‍රමාණයේ කඩදාසියක අපේක්ෂකයා විසින් ම සකස් කළ යුතුය.

(ආ) ඉල්ලුම්පතේ අංක 01 සිට 05 දක්වා කරුණු මුල් පිටුවේ සඳහන් කළයුතුය. ඉල්ලුම්පත්‍රය අපේක්ෂකයා සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට සුදුසුකම් ඇති භාෂාවෙන් පිරවිය යුතුය. කෙසේ වෙතත් ඉල්ලුම් පත්‍රය සකස් කරන විට එහි ශීර්ෂය රාජ්‍ය භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) සඳහන් කිරීම අත්‍යාවශ්‍ය වේ.

(ඇ) සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර නොමැති ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපැලේ දී අයදුම්පතක් නැතිවීම හෝ ප්‍රමාදවීම හෝ පිළිබඳව කෙරෙන අභියාචනා කිසිවක් සලකා බලනු නොලැබේ.

(ඈ) අපේක්ෂකයෙකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් ඔහු/ ඇය එය සාවද්‍ය බව දැන දැන ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත්, එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඔහු /ඇය ඕනෑකමින් යටපත් කර ඇත්නම්, පත්වීමක් ලැබීමට ඔහු/ ඇය නුසුදුස්සකු වීමට ඉඩ ඇත. රජයේ සේවයට පත්කළ පසුව මෙබන්දක් හෙළිවුවහොත් සේවයෙන් පහකළ හැකිය.

13. පත්වීම් ක්‍රියාත්මක වන දිනය හා පත් කරනු ලබන සංඛ්‍යාව රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් තීරණය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ සියල්ල පිරවීමට හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලය ඇත.

14. තෝරාගනු ලබන අපේක්ෂකයෙකු තුන් අවුරුදු පරිවාස කාලය අවසානයේ දී පත්වීම ස්ථිර කිරීමට පෙර පහත සඳහන් විෂයයන් ගෙන් සමන්විත පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත්විය යුතුය.

(i) රජයේ මූල්‍ය පරිපාටිය,
(ii) නීතිය හා කළමනාකරණය,
(iii) පරිපාලනය,
(iv) වාර්තා ලිවීම හා කළමනාකරණය වෙත තොරතුරු ඉදිරිපත් කිරීම.

15. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පළ කරනු ලබන මෙම දැන්වීමෙහි එක් එක් භාෂාවලින් පළ කිරීමේදී යම් නොගැලපීමක් ඇතිවුවහොත් සිංහල මාධ්‍යයෙන් පළ කරන ලද දැන්වීම බලාත්මක වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

එස්. ආලෝකබණ්ඩාර,
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත්
පාලන අමාත්‍යාංශය.

2025 මැයි මස 09 වැනි දින,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන
අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.